රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ
අංක : 181

මගේ අංකය : 543 ර 665 ඩී
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ – 7.
1980 ඔක්තෝබර් මස 31 වැනි දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත.

## පරිපාලන ව්‍යුහය හා ක්‍රියා පරිපාටි ප්‍රතිශෝධනය කිරීම

රජයේ වැඩපිළිවෙලවල් සීඝ්‍ර හා කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීමෙහි ලා ව්‍යාප්ත පරිපාලනමය ප්‍රතිශෝධනයක අවශ්‍යතාට සම්බන්ධයෙන් ගරු අගමැතිතුමා 1979.08.28 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සඳහන්කර ඇත. ඒ අනුව වෙළඳ හා නාවික කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්ද, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්ද, ඉඩම් හා ඉඩම් සංවර්ධන හා මහවැලි සංවර්ධන ගරු ඇමතිතුමා විසින් සහ ධීවර කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින්ද, පරිපාලනයේ ප්‍රතිශෝධනයක් සිදුකිරීම පිණිස යෝජනා ගණනාවක් ඇතුලත් සංදේශ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම සංදේශ හතරෙහි අඩංගු ප්‍රධාන නිර්දේශ සම්පිණ්ඩනය කරමින් (සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශයේ නිලධාරීන් පිරිසක් විසින් සකස් කරන ලද) 79.12.10 දිනැති ඒකාබද්ධ වාර්තාවක් 80.1.09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී සලකා බලනු ලැබීය.

2. ඒකාබද්ධ වාර්තාවේ 3 සිට 8 වන ඡේදයන්හි සාරාංශ කොට දැක්වුණු යෝජනා පිළිගැනීමට එකී රැස්වීමේදී තීරණය කළ අමාත්‍ය මණ්ඩලය එකී යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ විස්තර සංවර්ධන ලේකම්වරුන්ගේ කමිටුව විසින් සකස්කර අමාත්‍ය මණ්ඩලය වෙතට ඉදිරිපත් කළයුතු බවද දැක්වීය. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම්, වෙළඳ හා නාවික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, ධීවර අමාත්‍යාංශයේ ලේකම් හා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් යන ලේකම්වරුන්ගෙන් සමන්විත අනුකාරක සභාවක්, 80.1.29 දින පැවති සංවර්ධන ලේකම්වරුන්ගේ සාකච්ඡාවේදී මේ සඳහා පත්කර ගනු ලැබීය.

3. 80.07.30 දින පවත්වන ලද රැස්වීමේදී කමිටු වාර්තාවේ 1 සිට 25 දක්වා නිර්දේශවලට අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය දෙන ලදී.

4. ඔබේ දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා ඉහත සඳහන් වාර්තාවේ 8 සිට 19 දක්වා නිර්දේශයන්ගේ ඇමුණුමක් ඉදිරිපත් කරමි.

725.36
717.35
7.98

Siriwardana

රාජ්‍ය පරිපාලන ලේකම්.

ස/30